මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2023

7 ශ්‍රේණිය

චිත්‍ර කලාව

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

*ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.*

## I කොටස

★ **රූප සටහන ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01) මෙම සැලැස්ම නිර්මාණය කළේ කවුරුන් විසින් ද? ..........................................................

02) මෙම සැලැස්මේ දක්නට ලැබෙන ස්තූපය නම් කරන්න. ..........................................................

03) මෙම සැලැස්මෙන් නිරූපණය වන්නේ කුමක්ද? ..........................................................

04) මෙම සැලැස්මේ ඇති ස්තූපය අයත් වන යුගය නම් කරන්න. ..........................................................

05) වංශ කථා අනුව මෙම ස්තූපයේ තැම්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ධාතුන් ද?

..........................................................................................................

★ **අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06) විවිධ උත්සවවලදී පොල්තෙල් පහන තබන ස්ථානයේ බිම සැරසීම සඳහා යොදා ගනු ලබන සැරසිලි මෝස්තරය දක්වන්න.

1) මොනොක්‍රෝම් 2) ග්‍රැෆික් 3) අල්පනා 4) කොලාජ්

07) මාළුවකුගේ හැඩයක් ඇඹීම සඳහා වඩාත්ම සුදුසු පහසුම මාධ්‍යය වනුයේ

1) සබන් 2) රෙජිෆෝම් 3) පල්ප් 4) මැටි

08) චිත්‍ර කලාවේ ළඟ දේ විශාලවත් දුර දේ කුඩාවටත් දක්වා තිබීම හඳුන්වන්නේ

1) සිතිජය නමිනි 2) පර්යාවලෝකනය නමිනි

3) ත්‍රිමාණ ලක්ෂණ නමිනි 4) මනා සම්පිණ්ඩනයක් නමිනි

09) මූලික වර්ණවලින් සෑදෙන ද්විතීය වර්ණ කාණ්ඩය වන්නේ
   1) රතු, නිල්, කොළ
   2) තැඹිලි, නිල්, දම්
   3) කොළ, දම්, තැඹිලි
   4) කොළ, රතු, තැඹිලි

10) ටෙම්ප්ලේට් චිත්‍රයක් නිර්මාණය කිරීමේ දී සුදුසු ම මාධ්‍ය වන්නේ
   1) දිය සායම්
   2) පැස්ටල්
   3) තෙල් සායම්
   4) පාට පැන්සල්

★ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



E F G H I

11) ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත වූ ස්තූපය ……………….. අක්ෂරයෙන් දැක්වේ.

12) ……………….. අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු යුගයේ නිශ්ශංකමල්ල රජුගේ නිර්මාණයකි.

13) ක්‍රි.පූ. 1 වන ශතවර්ෂයේ දී වළගම්බා රජු විසින් කරවන ලද ස්තූපය ……………….. අක්ෂරයෙන් දැක්වේ.

14) ………………….. අක්ෂරයෙන් දැක්වෙන ස්තූපයේ වැඩ කටයුතු අවසන් වීමට පෙර එය කරවූ රජතුමාගේ අභාවය සිදුවිය.

15) දේවානම්පියතිස්ස රජු විසින් බුදුන්ගේ "දකුණු අකු ධාතුව" තැන්පත් කර තැනූ දාගැබ ………………….. අක්ෂරයෙන් දැක්වේ.

★ **අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රකාශවලට ගැළපෙන රූපය** A, B, C, D, E **යන රූප අතුරින් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**



A B C D E

16) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් D අක්ෂරයෙන් දැක්වෙන සිතුවම හමුවන ගුහාව නම් කරන්න.

……………………………………………………………………………………………

17) A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද? ……………………………………………………………

18) E අක්ෂරයෙන් දැක්වෙන සිතුවම දොරවක ගුහාවෙන් හමුවේ. එය හඳුන්වන නම කුමක්ද?

……………………………………………………………………………………………

19) C අක්ෂරයෙන් දැක්වෙන ස්තූපය නම් කරන්න. ……………………………………………………

20) ප්‍රසිද්ධ චරිතයක් B අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න. ………………………………………

★ **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද තිත් ඉර මත ලියන්න.**

21) මැටි මාධ්‍යයෙන් කරන ලද මූර්තියක් වියලෙන්නට පෙර වර්ණ කිරීමෙන් වර්ණවල ගුණාත්මක බව වැඩිවෙයි. (………..)

22) රූකඩ නිර්මාණය සඳහා කඳුරු ලී උපයෝගී කරගනී. (………..)

23) රජයේ ආයතනයක නාම පුවරුවක් නිර්මාණය කිරීමේ දී නිර්මාණ අක්ෂර කලාව භාවිතයට ගත හැක. (………..)

24) වටදාගෙය චෛත්‍යයේ අත්‍යවශ්‍ය අංගයකි. (………..)

25) දම් යනු නිල් වර්ණයේ සහ රතු වර්ණයේ එකතුවකි. (………..)

★ **දී ඇති රූප සටහන ආධාරයෙන් අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සපයන්න.**




26) කොළ වර්ණය සාද ගැනීම සඳහා ඔබ B හා C සඳහා යොදා ගත් වර්ණ දෙක නම් කරන්න.

………………………………………………………………………………………………

27) ඔබ C සඳහා නිල් වර්ණය යෙදුවොත් A වලට යොදන්නේ කුමන වර්ණය ද? ………………………………

28) A සහ B එකතු වී Eවල සෑදෙන වර්ණය කුමක්ද? ………………………………………………………

29) Dවල සෑදෙන ද්විතිය වර්ණය නම් කරන්න. ………………………………………………………………

30) Aවලට විරුද්ධ වර්ණය කුමක්ද? ……………………………………………………………………………

## II කොටස

**පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

1) ඇළක ගඟක දිය නාන මිතුරන්
2) වනයේ සැරි සරන සතුන්
3) පෝය දා පන්සල
4) කුෂන් කවරයක් සඳහා මුළුතල මෝස්තරයක්
5) මල්, කොළ, ගෙඩි ඇසුරෙන් චීත්ත රෙද්දකට ගැළපෙන මෝස්තරයක් නිර්මාණය කරන්න.
6) පාසලේ විවිධ ප්‍රසංගය සඳහා දැන්වීමක් (පෝස්ටරයක්) නිර්මාණය කරන්න.